ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2017 ජූලි මස 07 වැනි දින** |

## 2017 අප්‍රේල් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

2017 වසරේ අප්‍රේල් දී මාසයේ ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. 2017 අප්‍රේල් මාසයේ දී අපනයන ආදායම වර්ධනය වුවද, ආනයන වියදම වැඩි වේගයකින් ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හිඟය ද පුළුල් විය. 2017 අප්‍රේල් මාසයේ දී සංචාරක ඉපැයීම් ඉහළ ගියද, පුළුල් වූ වෙළඳ හිඟය සමඟ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ද අඩුවීම හේතුවෙන් විදේශීය ජංගම ගිණුම මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, කොළඹ කොටස් හුවමාරුව සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ අඛණ්ඩ විදේශ විනිමය ලැබීම් හේතුවෙන් ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම සවිමත් විය.

**අපනයන ක්‍රියාකාරිත්වය**

2017 අප්‍රේල් මාසයේ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 795 ක් දක්වා සියයට 11.9 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කරමින් අඛණ්ඩව දෙවැනි මාසයටත් ඉහළ ගියේය. 2013 අප්‍රේල් මාසයෙන් පසු අඩුම අපනයන ආදායම වාර්තා කරමින් 2016 අප්‍රේල් මාසයේ අපනයන ආදායම සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතීම 2017 වසරේ අපනයන ආදායමෙහි ඉහළ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය.

මුළු අපනයන ආදායමෙන් සියයට 75 ක් පමණ වන කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 595 ක් දක්වා සියයට 8.6 කින් වර්ධනය වූ අතර, ප්‍රවාහන උපකරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ රෙදිපිළි හා ඇඟලුම් අපනයන ඉහළ යෑම ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. එ.ජ. ඩොලර් මිලියන 23 ක වටිනාකමකින් යුත් භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා යාත්‍රාවක් අපනයනය කිරීම හේතුවෙන් මෙම මාසයේ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 27 ක් දක්වා ආසන්න වශයෙන් පස් ගුණයකින් ඉහළ ගියේය. නැව් සහ ගුවන් යානා සඳහා භාවිත කරනු ලබන ඉන්ධන අපනයන පරිමාවෙහි සහ අපනයන මිල ගණන්වල ඉහළ යෑම් පෙන්නුම් කරමින් 2017 අප්‍රේල් මාසයේ දී ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 62.5 කින් ඉහළ ගියේය. 2017 අප්‍රේල් මාසයේ රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම ඍතුමය වෙනස්කම් හේතුවෙන් පසුගිය මාසයට සාපේක්ෂව පහළ ගියද, පසුගිය වසරේ අප්‍රේල් මාසය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 351 ක් දක්වා සියයට 3.0 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය විය. 2016 අප්‍රේල් මාසය හා සැසඳීමේ දී, 2017 අප්‍රේල් මාසයේ දී යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත සහ දැව හා කඩදාසි නිෂ්පාදිත අපනයන ආදායම්වල ඉහළ වර්ධනයක් දක්නට ලැබිණි. කෙසේ වුවද, 2017 අප්‍රේල් මාසයේ දී මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් සහ මූල ලෝහ හා ඒ ආශ්‍රිත උපාංග අපනයන ආදායම් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ පහළ ගියේය.

2017 අප්‍රේල් මාසයේ කෘෂිකාර්මික අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 196 ක් දක්වා සියයට 22.7 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම තේ, කුළුබඩු හා මුහුදු ආහාර අපනයන ඉහළ යෑම හේතු විය. අපනයන පරිමාවේ අඩුවීමක් දක්නට ලැබුණද, සාමාන්‍ය අපනයන මිල ඉහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 109 ක් දක්වා සියයට 17.1 කින් වර්ධනය විය. 2016 සැප්තැම්බර් මාසයේ සිට දක්නට ලැබුණු තේ අපනයන මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවය පිළිබිඹු කරමින් 2016 අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් 4.20 ක් වූ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල 2017 අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් 5.42 දක්වා ඉහළ ගියේය. 2017 අප්‍රේල් මාසයේ කුළුබඩු අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 78.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, ඒ සඳහා කුරුඳු හා කරාබුනැටි අපනයන පරිමා ඉහළ යෑම හේතුවිය. මෙයට අමතරව, මත්ස්‍ය නිෂ්පාදිත අපනයන සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීමෙන් පසු 2017 අප්‍රේල් මාසයේ දී යුරෝපා සංගමය වෙත

සිදුකළ මුහුදු ආහාර අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 251 කින් වර්ධනය වීම හේතුවෙන් මුහුදු ආහාර අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 59.7 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, 2017 අප්‍රේල් මාසයේ දී පොල් හා රබර් නිෂ්පාදිත අපනයන ආදායම් පහළ ගියේය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, 2017 වසරේ පළමු මාස හතර සඳහා වූ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 3,569 ක් දක්වා සියයට 3.5 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා තේ, කුළුබඩු, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත හා මුහුදු ආහාර අපනයන ආදායම් ඉහළ යෑම හේතු විය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ රෙදිපිළි හා ඇඟලුම්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයනයෙන් ලද ආදායම් පහළ ගියේය.

2017 වසරේ පළමු මාස හතර තුළ දී ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයනය සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය ප්‍රධාන වෙළඳපොළ ලෙස පැවැති අතර, එම රටවල් වෙත සිදු කළ අපනයන මුළු අපනයන ආදායමෙන් සියයට 51 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2016 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 ජන-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **547.9** | **594.9** | **8.6** | **2,713.5** | **2,701.5** | **(0.4)** |
| රෙදිපිළි හා ඇඟලුම් | 340.5 | 350.5 | 3.0 | 1,709.8 | 1,626.3 | (4.9) |
| එයින් ඇඟලුම් | 319.4 | 330.7 | 3.5 | 1,613.4 | 1,531.7 | (5.1) |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 20.6 | 24.6 | 19.6 | 94.5 | 126.5 | 33.8 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 18.2 | 29.5 | 62.5 | 92.3 | 120.1 | 30.1 |
| ආහාර, පාන හා දුම්කොළ | 24.7 | 24.9 | 0.9 | 117.4 | 101.4 | (13.6) |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 23.8 | 16.4 | (31.0) | 98.8 | 80.9 | (18.1) |
| ප්‍රවාහන උපකරණ | 5.5 | 27.4 | 400.7 | 52.5 | 66.3 | 26.3 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 10.7 | 8.3 | (22.1) | 49.8 | 49.2 | (1.2) |
| මූල ලෝහ හා උපාංග | 8.3 | 7.7 | (7.4) | 23.8 | 35.3 | 47.9 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 0.6 | 2.7 | 370.4 | 6.6 | 12.7 | 94.2 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.1 | 2.3 | 8.4 | 11.6 | 10.5 | (9.9) |
| වෙනත් | 93.0 | 100.3 | 7.9 | 456.4 | 472.1 | 3.5 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **159.5** | **195.8** | **22.7** | **721.8** | **851.7** | **18.0** |
| තේ | 93.2 | 109.1 | 17.1 | 406.3 | 458.2 | 12.8 |
| පොල් | 27.0 | 24.8 | (8.3) | 114.8 | 115.7 | 0.8 |
| කුළුබඩු | 13.0 | 23.2 | 78.4 | 73.9 | 109.2 | 47.7 |
| මුහුදු ආහාර | 11.4 | 18.3 | 59.7 | 57.9 | 84.2 | 45.4 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 8.0 | 12.7 | 59.4 | 36.1 | 45.3 | 25.6 |
| රබර් | 2.7 | 2.6 | (5.6) | 12.6 | 19.0 | 50.5 |
| සකස් නොකළ දුම්කොළ | 2.2 | 2.5 | 11.5 | 11.4 | 10.4 | (8.6) |
| එළවළු | 1.9 | 2.7 | 39.6 | 8.7 | 9.6 | 10.4 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **2.9** | **4.0** | **37.0** | **14.3** | **15.8** | **10.9** |
| **මුළු අපනයන** | **710.4** | **794.7** | **11.9** | **3,449.6** | **3,569.0** | **3.5** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

**ආනයන ක්‍රියාකාරිත්වය**

2017 අප්‍රේල් මාසයේ ආනයන වියදම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 1,604 ක් දක්වා සියයට 9.8 කින් ඉහළ ගියේය. සමස්ත ආනයන වියදම ඉහළ යෑම සඳහා අන්තර් භාණ්ඩ ආනයන (සියයට 74.7 කින්) වැඩිම දායකත්වයක් ලබාදුන් අතර, පාරිභෝගික භාණ්ඩ ආනයන සියයට 20.2 කින් සහ ආයෝජන භාණ්ඩ ආනයන සියයට 5.7 කින් මේ සඳහා දායක විය.

2017 අප්‍රේල් මාසයේ අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 886 ක් දක්වා සියයට 13.7 කින් ඉහළ ගිය අතර, ඉන්ධන හා මූල ලෝහ ආනයන වියදම් ඉහළ යෑම ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. විදුලි බල උත්පාදනය සඳහා තෙල් හා ගල් අඟුරු ආනයන පරිමාව ඉහළ යෑමත්, ගෝලීය වෙළඳපොළ තුළ ඉන්ධන ආනයන මිල ගණන් ඉහළ යෑමත් පිළිබිඹු කරමින් මෙම මාසය තුළ ඉන්ධන ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 62.1 කින් ඉහළ ගියේය. 2016 අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් 44.05 ක් වූ ඛනිජතෙල් බැරලයක ආනයන මිල 2017 අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් 56.48 ක් දක්වා ඉහළ ගියේය. මීට අමතරව, යකඩ හා වානේ මූලික කරගත් මූල ලෝහ ආනයන වියදම ඉහළ යෑමත්, විශේෂයෙන්ම රත්‍රන් සඳහා වූ වියදම ද ඇතුළත්ව දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග, ආනයන වියදම ඉහළ යෑමත්, අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම කෙරෙහි කැපී පෙනෙන ලෙස බලපෑවේය. කෙසේ වුවද, 2016 අප්‍රේල් මාසය හා සැසඳීමේදී, 2017 අප්‍රේල් මාසයේ දී තිරිඟු හා ඉරිඟු, පොහොර, රසායනික නිෂ්පාදිත සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග සඳහා වූ ආනයන වියදම් පහළ ගියේය.
2017 අප්‍රේල් මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 345 ක් දක්වා සියයට 9.1 කින් ඉහළ ගිය අතර, රථවාහන සහ විදුලි සංදේශ උපකරණ ආනයන වියදම්වල පහළ යෑමක් සිද වුවද, රෙදිපිළි හා උපාංග, ගෘහ භාණ්ඩ සහ ගෘහ උපකරණ වැනි ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම් ඉහළ යෑම ඒ සඳහා හේතු විය. සහල්, කිරි ආශ්‍රිත නිෂ්පාදිත සහ එළවළු ආනයනය සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ආහාර හා පාන වර්ග ආනයන වියදම් ද ඉහළ ගියේය. දේශීය වෙළඳපොළ තුළ පැවති සහල් හිඟය සපුරාලීමට සහල් ආනයන දිරිගැන්වීම සඳහා රජය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් 2016 අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1 ක් ව පැවති සහල් ආනයන වියදම 2017 අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 10 ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වුවද, මෙම මාසය තුළ සීනි, කුළුබඩු, රබර් නිෂ්පාදිත ආනයන වියදම් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී පහළ ගියේය.

2017 අප්‍රේල් මාසයේ ආයෝජන භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී  එ.ජ. ඩොලර් මිලියන 372 ක් දක්වා සියයට 2.3 කින් වර්ධනය වූ අතර, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ ආනයන වියදම් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතුවිය. 2017 අප්‍රේල් මාසයේ යකඩ හා වානේ සහ සිමෙන්ති ආනයනය ඉහළ යෑම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම් ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන්ම වාණිජ කටයුතු සඳහා යොදාගන්නා රථවාහන ආනයන ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ විදුලි මෝටර් හා විදුලිජනක යන්ත්‍ර සහ රෙදිපිළි කර්මාන්තය සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර ආනයනය පහළ යෑම හේතුවෙන් යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම් පහළ ගියේය.

සමුච්චිත වශයෙන් සැලකූවිට, ප්‍රධාන වශයෙන්ම ඉන්ධන, රත්‍රන් සහ සහල් ආනයනය විශාල වශයෙන් ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ පළමු මාස හතර තුළ ආනයන වියදම 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී  එ.ජ. ඩොලර් මිලියන 6,883 ක් දක්වා සියයට 13.7 කින් ඉහළ ගියේය. ඉන්ධන හා රත්‍රන් ආනයන වියදම් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී පිළිවෙළින් සියයට 76.0 කින් සහ සියයට 158.2 කින් ඉහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළ සහල් ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී විසි අට ගුණයකට වඩා වැඩි  ප්‍රමාණයකින් ඉහළ ගිය අතර ඒ සඳහා සහල් ආනයන පරිමාව ඉහළ යෑම හේතුවිය. කෙසේ වුවද, මෙම කාලය තුළ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, රථවාහන සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී පහළ ගියේය.

2017 වසරේ පළමු මාස හතර තුළ ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභවයන් වූ අතර, මෙම රටවල් වෙතින් සිදු කරන ලද ආනයන මුළු ආනයනවලින් සියයට 59 ක් පමණ විය.


## සංඛ්‍යා සටහන 2: ආනයන වියදම (අ)


| කාණ්ඩය | 2016 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2017 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන- අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන- අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **316.2** | **345.1** | **9.1** | **1,425.5** | **1,515.6** | **6.3** |
| ආහාර හා පාන වර්ග | 117.4 | 123.9 | 5.6 | 516.9 | 629.2 | 21.7 |
| එළවළු | 18.4 | 22.8 | 23.5 | 140.1 | 124.3 | (11.3) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.9 | 11.2 | 473.3 | 6.9 | 114.6 | 1,552.0 |
| කිරි නිෂ්පාදිත | 17.4 | 25.6 | 47.3 | 74.1 | 110.4 | 49.0 |
| සීනි හා රසකැවිලි | 29.3 | 22.8 | (22.2) | 94.3 | 86.6 | (8.2) |
| කුළුබඩු | 10.1 | 5.6 | (44.8) | 45.0 | 33.0 | (26.6) |
| පාන වර්ග | 9.5 | 6.1 | (35.8) | 25.7 | 25.7 | 0.2 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 30.7 | 29.9 | (2.5) | 130.7 | 134.6 | 2.9 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 198.9 | 221.2 | 11.2 | 908.6 | 886.5 | (2.4) |
| රථවාහන | 67.2 | 56.3 | (16.2) | 298.9 | 248.2 | (17.0) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 20.7 | 56.7 | 174.7 | 120.2 | 143.5 | 19.4 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 111.0 | 108.1 | (2.6) | 489.6 | 494.8 | 1.1 |
| **2. අන්තර් භාණ්ඩ** | **778.9** | **885.7** | **13.7** | **3,019.2** | **3,692.2** | **22.3** |
| ඉන්ධන | 200.8 | 325.6 | 62.1 | 686.5 | 1,208.3 | 76.0 |
| එයින් බොරතෙල් | 30.5 | 81.5 | 167.2 | 126.5 | 207.6 | 64.2 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 151.3 | 204.6 | 35.2 | 465.1 | 829.9 | 78.4 |
| ගල්අඟුරු | 19.1 | 39.5 | 107.4 | 95.0 | 170.8 | 79.8 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 39.0 | 49.6 | 27.2 | 119.8 | 224.6 | 87.5 |
| එයින් රත්‍රන් | 26.9 | 41.6 | 54.8 | 74.8 | 193.1 | 158.2 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 198.3 | 193.9 | (2.2) | 896.8 | 860.6 | (4.0) |
| රසායනික නිෂ්පාදිත | 71.6 | 63.5 | (11.4) | 281.1 | 274.2 | (2.5) |
| මූල ලෝහ | 26.5 | 39.9 | 50.4 | 105.4 | 192.6 | 82.7 |
| තිරිඟු හා ඉරිඟු | 51.1 | 35.2 | (31.2) | 105.6 | 117.8 | 11.5 |
| ආහාර සැකසුම් | 15.8 | 21.8 | 37.7 | 75.0 | 98.7 | 31.6 |
| ඛනිජ නිෂ්පාදිත | 7.7 | 9.3 | 20.2 | 51.8 | 54.5 | 5.1 |
| පොහොර | 13.0 | 2.8 | (78.6) | 54.1 | 22.6 | (58.1) |
| වෙනත් | 154.9 | 144.2 | (6.9) | 643.1 | 638.3 | (0.7) |
| **3. ආයෝජන භාණ්ඩ** | **364.3** | **372.5** | **2.3** | **1,607.8** | **1,614.6** | **0.4** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 212.8 | 185.7 | (12.8) | 925.2 | 871.9 | (5.8) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 113.8 | 134.3 | 18.1 | 485.3 | 524.1 | 8.0 |
| ප්‍රවාහන උපකරණ | 37.3 | 51.6 | 38.2 | 195.1 | 215.1 | 10.3 |
| වෙනත් | 0.3 | 0.9 | 160.8 | 2.2 | 3.4 | 53.7 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.5** | **0.6** | **(59.2)** | **2.8** | **60.9** | **2,061.4** |
| **මුළු ආනයන** | **1,460.9** | **1,603.9** | **9.8** | **6,055.4** | **6,883.3** | **13.7** |

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

### රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

**වෙළඳ ශේෂය**

2017 අප්‍රේල් මාසයේ වෙළඳ හිඟය, 2016 වසරේ අප්‍රේල් මාසයේ දී පැවැති එ.ජ. ඩොලර් මිලියන 751 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 809 ක් දක්වා සැලකිය යුතු ලෙස පුළුල් විය. 2017 වසරේ පළමු මාස හතර තුළ සමුච්චිත වෙළඳ හිඟය, 2016 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,606 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 3,314 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**සංචාරක ඉපැයීම්**

පසුගිය මාස දෙකක කාලය තුළ දී පහත වැටුණු සංචාරක පැමිණීම්, 2017 අප්‍රේල් මාසයේ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 160,249 ක් දක්වා සියයට 17.5 කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2017 වසරේ පළමු මාස හතර තුළදී සංචාරකයින්ගේ පැමිණීම් ප්‍රමාණය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ 721,185 හා සැසඳීමේ දී 765,202 ක් දක්වා සියයට 6.1 කින් වර්ධනය විය. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය හා ප්‍රංශය යන රටවල් 2017 වසරේ පළමු මාස හතර තුළ දී සංචාරකයින් පැමිණෙන ප්‍රධාන මූලාශ්‍ර වූ අතර, එම රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මෙම කාලපරිච්ඡේදයේ දී පැමිණි මුළු සංචාරකයින්ගෙන් සියයට 50.3 ක් විය. ඒ අනුව, 2017 වසරේ අප්‍රේල් මාසයේ දී

සංචාරක ඉපැයීම්[1] 2016 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 234.0 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 274.9 ක් දක්වා වර්ධනය විය. මේ අතර, 2017 වසරේ පළමු මාස හතර තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 1,312.8 ක් දක්වා සියයට 6.1 කින් වර්ධනය විය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

මැද පෙරදිග කලාපයේ පවතින අහිතකර ආර්ථික හා භූ දේශපාලනික තත්ත්වය විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මත තවදුරටත් අහිතකර බලපෑමත් ඇති කළේය. 2017 වසරේ අප්‍රේල් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2016 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 578.0 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 487.9 ක් දක්වා සියයට 15.6 කින් අඩු විය. තවද, 2017 වසරේ පළමු මාස හතර තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම් ද, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, එ.ජ. ඩොලර් මිලියන 2,221.7 ක් දක්වා සියයට 6.3 කින් අඩුවිය.

**මූල්‍ය ලැබීම්**

වසරේ පළමු මාස හතර තුළ දී, කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 154.5 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, එය ද්විතීයික වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 106.3 කින් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 48.2 කින් සමන්විත විය. පෙර මාසයේ දී පැවති ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා ගනිමින්, 2017 වසරේ අප්‍රේල් මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 45 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. කෙසේ වුවද, 2017 වසරේ පළමු මාස හතර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ සමුච්චිත විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 360.4 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. 2017 වසරේ පළමු මාස හතර තුළ දී රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 7.6 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 60.3 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. තවද, 2017 වසරේ පළමු කාර්තුවේ දී කාර්තුමය පදනම මත වාර්තා කරනු ලබන ආයෝජන මණ්ඩලයේ සමාගම් සඳහා වූ විදේශීය ණය ද ඇතුළත් විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 146.5 ක මධ්‍යස්ථ මට්ටමක පැවැතිණි. කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2017 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

සමාගම් කිහිපයක් විසින් සිදු කරන ලද කොටස් ආපසු මිලදී ගැනීම්වල ප්‍රතිඵලයක් ලෙස වූ ආයෝජන ඉවත් කර ගැනීම් ද මෙහි අන්තර්ගත විය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2017 වසරේ පළමු මාස හතර තුළ දී සමස්ත ගෙවුම් තුලනය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 958.1 ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 344.4 ක හිඟයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2017 වසරේ අප්‍රේල් මස අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 3.0 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 5.0 ක් වූ අතර, මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 4.5 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 7.5 ක් විය.

විනිමය අනුපාතික හැසිරීම් අනුව, ශ්‍රී ලංකා රුපියල 2016 වසර අවසානයේ සිට 2017 ජූලි මස 06 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී, සියයට 2.6 ක මධ්‍යස්ථ අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතිකවල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන ව්‍යහාර මුදල් ඒකක වන යූරෝවලට සාපේක්ෂව සියයට 9.4 කින් ද, ස්ටර්ලින් පවුමට සාපේක්ෂව සියයට 7.4 කින් ද, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 5.4 කින් ද, කැනේඩියානු ඩොලරයට සාපේක්ෂව සියයට 6.2 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව සියයට 7.1 කින් ද සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 7.0 කින් ද අවප්‍රමාණය විය.

## සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2016 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2017 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන- අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන- අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 710.4 (ආ) | 794.7 | 11.9 | 3,449.6(ආ) | 3,569.0 | 3.5 |
| ආනයන | 1,460.9 | 1,603.9 | 9.8 | 6,055.4 | 6,883.3 | 13.7 |
| වෙළඳ ශේෂය | -750.5 (ආ) | -809.2 | 7.8 | -2,605.8(ආ) | -3,314.3 | 27.2 |
| සංචාරක ඉපැයීම් | 234.0 (ආ) | 274.9 | 17.5 | 1,237.3 (ආ) | 1,312.8 | 6.1 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 578.0 | 487.9 | -15.6 | 2,371.4 | 2,221.7 | -6.3 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | -7.0 | 71.1 | -1,116.7 | -19.5 | 154.5 | -892.5 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 271.4 (ආ) | 161.3 | -40.6 | 537.4 (ආ) | 788.3 | 46.7 |
| එයින්, | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 174.4 | 103.2 | -40.8 | 217.7 | 385.2 | 77.0 |
| දිගුකාලීන ණය | 92.2 (ආ) | 58.1 | -37.0 | 309.6 (ආ) | 395.2 | 27.6 |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | - | 129.4 | 146.5 | 13.2 |

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ඒකාබද්ධ ණය පහසුකම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඉ) දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා පමණක් වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ විදේශීය ආයෝජන ද ඇතුළත්ය.